මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව(IRCSL), ලොවපුරා ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා වන පදනම(FALIA) සහ ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය(IASL) එක්ව පාසල් දරුවන් සඳහා සංවිධානය කරන ජීවිත රක්ෂණය පිළිබඳ ජාතික රචනා තරඟය: මූල්‍ය සාක්ෂරතාව තුළින් අනාගත පරපුර බලගැන්වීම.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, ලොවපුරා ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා වන පදනම (ජපානය) සහ ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය එක්ව, **"පාසල් දරුවන් සඳහා වන ජීවිත රක්ෂණය පිළිබඳ ජාතික රචනා තරඟය - 2026"** පැවැත්වීමට කටයුතු යොදා තිබෙන බව බව සතුටින් දැනුම් දෙයි.

අධ්‍යාපනය, පර්යේෂණ සහ ජාත්‍යන්තර සහයෝගීතාවය තුළින් මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සහ ජීවිත රක්ෂණය පිළිබඳ මහජන අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා කැපවූ ලාභ ලැබීම පරමාර්ථය කර නොගත් ජාත්‍යන්තර සංවිධානයක් වන ජපානයේ ලොවපුරා ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා වන පදනමේ සහයෝගය ඇතිව මෙම තරඟය සංවිධානය කරනු ලබයි.

"තරුණ සිත් පුබුදමු. හෙට දවස සුරක්ෂිත කරමු" යන තේමාව ඔස්සේ ක්‍රියාත්මක වන මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ ජීවිත රක්ෂණය පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම, අනාගත මූල්‍ය අවශ්‍යතා සඳහා සූදානම් වීමේ වැදගත්කම සහ දැනුවත් මූල්‍ය තීරණ ගැනීමේ අගය ප්‍රවර්ධනය කරමින් පාසල් දරුවන් අත්‍යවශ්‍ය මූල්‍ය දැනුමින් සවි බලගැන්වීමයි.

පාසල් දරුවන්ගේ ලේඛන, විශ්ලේෂණ සහ සන්නිවේදන කුසලතා වර්ධනය කරන අතරම පවුලේ මූල්‍ය සුරක්ෂිතතාවය, දීර්ඝකාලීන මූල්‍ය සැලසුම්කරණය, අවදානම් කළමනාකරණය සහ ආර්ථික ස්ථාවරත්වය පිළිබඳව තාර්කිකව සිතීමට ඔවුන් දිරිමත් කිරීම සඳහා මෙම තරඟය නිර්මාණය කර ඇත.

ශ්‍රී ලංකාව පුරා පිහිටි **රජයේ, පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසල්වල** ඉගෙනුම් ලබන දරුවන් සඳහා මෙම තරඟය විවෘත වන අතර එය **සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි** යන භාෂා ත්‍රිත්වයෙන්ම පැවැත්වේ.

වයස් කාණ්ඩ සහ සුදුසුකම්

මෙම රචනා තරඟය වයස් කාණ්ඩ දෙකක් යටතේ පැවැත්වේ:

- **කනිෂ්ඨ අංශය (වයස අවුරුදු 13-16)**

  ළමුන් 2010 ජනවාරි 1 දින සහ 2013 දෙසැම්බර් 31 දින අතර උපත ලබා තිබිය යුතුය.

- **ජ්‍යෙෂ්ඨ අංශය (වයස අවුරුදු 17-19)**

  ළමුන් 2007 ජනවාරි 1 දින සහ 2009 දෙසැම්බර් 31 දින අතර උපත ලබා තිබිය යුතුය.

2026 ජූලි 15 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා ලියාපදිංචි වීම සඳහා අවස්ථාව ඇත. ලියාපදිංචි වීමට පෙර ලියාපදිංචි වීමේ උපදෙස් සැලකිල්ලෙන් යුතුව කියවා බලන ලෙසත් තමන්ගේ පාසල පිළිබඳ තොරතුරු, මව්පියන් හෝ භාරකරුව සම්බන්ධ කරගත හැකි සබඳතා තොරතුරු සූදානම්ව තබා ගන්නා ලෙසත්, තරඟයට ඉදිරිපත්වීමට කැමති දිස්ත්‍රික්කය තෝරා ගෙන **වලංගු ඊමේල් ලිපිනයක් සහ ජංගම දුරකථන අංකයක්** ලබා දෙන ලෙසත් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

මෙම රචනා තරඟය 2026 **ඔක්තෝබර්** මාසයේ දී ශ්‍රී ලංකාවේ සමස්ත දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි නියමිත විභාග මධ්‍යස්ථානවලදී අධීක්ෂණය කෙරෙන විභාගයක් ලෙස පැවැත්වේ. විභාගය පැවැත්වෙන දිනයේ

දී ලබා දෙන රචනා ප්‍රශ්න හතරෙන් එක් ප්‍රශ්නයක් තෝරාගෙන ඊට පිළිතුරු සැපයීමට තරඟකරුවන්ට සිදු වේ. විභාගය සඳහා හිමිවන උපරිම කාලය පැය 01 යි මිනිත්තු 30 කි.

දිවයිනේ සෑම ප්‍රදේශයකම සිටින දරුවන්ට මෙම තරඟය සඳහා සහභාගී වීමට සමාන අවස්ථාවක් හිමි වන අතර තරඟකරුවන්ට **සම්පූර්ණයෙන්ම නොමිලේ** තරඟය සඳහා සහභාගී විය හැක.

මූල්‍ය සැලසුම්කරණයේ ප්‍රධාන මෙවලමක් ලෙස ජීවිත රක්ෂණය, පවුලේ මූල්‍ය ආරක්ෂණය සැපයීම, මූල්‍ය සුරක්ෂිතභාවය තහවුරු කිරීම, අහිමි වූ ආදායම ප්‍රතිස්ථාපනය කිරීම, දීර්ඝකාලීන ඉතිරිකිරීම් සඳහා සහය වීම, අනාගත අවශ්‍යතා සැලසුම් කිරීම, මූල්‍ය අවදානම් කළමනාකරණය, ආර්ථික ස්ථාවරත්වයට දායක වීම, පවුල් සංස්ථාවේ යහපැවැත්ම ඉහළ නැංවීම සහ පුද්ගලයන්ට තමන්ගේ ජීවිත ඉලක්ක සපුරා ගැනීමට උපකාරී වීම යන ක්ෂේත්‍රවලට අදාළ ප්‍රධාන සංකල්ප පිළිබඳ අවබෝධයක් ලබා ගනිමින් තරඟය සඳහා සූදානම් වන ලෙස පාසල් දරුවන් දිරිමත් කරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනයේදී මෙම සංකල්ප ඇසුරින් සකස් කළ නිශ්චිත ප්‍රශ්නවලින් එකක් මත පදනම්ව රචනයක් ලිවීමට තරඟකරුවන්ට සිදු වනු ඇත.

මෙම තරඟයේ කනිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ දෙඅංශයේම ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා ආකර්ෂණීය මුදල් ත්‍යාග පිරිනමනු ලැබේ:

- **ප්‍රථම ස්ථානය: රු. 75,000**
- **දෙවන ස්ථානය: රු. 50,000**
- **තෙවන ස්ථානය: රු. 25,000**

මීට අමතරව, කාණ්ඩ දෙකම යටතේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි **දිස්ත්‍රික් කුසලතා සම්මානලාභීන් 144** දෙනෙකු තෝරා ගනු ලබන අතර එලෙස තෝරාගත් සෑම අයෙකුටම රුපියල් 5,000 ක මුදල් ත්‍යාගයක් හිමිවේ.

ජාතික මට්ටමේ ජයග්‍රාහකයින්ට සහ දිස්ත්‍රික් කුසලතා සම්මානලාභීන්ට මුද්‍රිත සහතික පත්‍ර පිරිනැමෙන අතර, සහභාගී වූ සෑම තරඟකරුවෙකුටම ඔවුන්ගේ සහභාගීත්වය අගයමින් **නිල ඉලෙක්ට්‍රොනික සහතික පත්‍රයක් (e-certificate)** පිරිනැමෙනු ඇත.

තරුණ පරපුර අතර මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම රටේ අනාගතය වෙනුවෙන් කෙරෙන වැදගත් ආයෝජනයක් ලෙස ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව හඳුනා ගෙන ඇත. කුඩා අවදියේ සිටම ජීවිත රක්ෂණයේ වැදගත්කම, මූල්‍ය සුරක්ෂිතතාව සහ වගකීම් සහගත මූල්‍ය සැලසුම්කරණය පිළිබඳව සිසුන්ට අවබෝධ කර දීම තුළින් ඥානාන්විත මූල්‍ය තීරණ ගනිමින් මූල්‍යමය වශයෙන් සුරක්ෂිත සමාජයක් ගොඩනැගීමට දායක විය හැකි, දැනුවත් මෙන්ම වගකීම් සහගත පරපුරක් බිහිකිරීම මෙම වැඩසටහනේ අරමුණයි.

මෙම ජාතික වැඩසටහන සඳහා සුදුසුකම් ලබන පාසල් ශිෂ්‍යයන් දිරිමත් කරමින් තරඟයට සහභාගී කරවීමට සහ සූදානම් කිරීමට දායක වන ලෙස දෙමාපියන්, ගුරුවරුන් සහ විදුහල්පතිවරුන්ගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනු ලැබේ. ඔවුන්ගේ මගපෙන්වීම සහ දිරිගැන්වීම, මූල්‍ය සැලසුම්කරණය සහ තම අනාගතය සුරක්ෂිත කරගැනීමේදී ජීවිත රක්ෂණය ඉටුකරන වැදගත් කාර්යභාරය පිළිබඳව දරුවන්ගේ අවබෝධය වර්ධනය කරගැනීමට උපකාරී වනු ඇත.

ලියාපදිංචිය, තරඟ මාර්ගෝපදේශ සහ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.ircsl.gov.lk වෙත හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිල සමාජ මාධ්‍ය නාලිකා වෙත පිවිසෙන්න.



ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වන මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01

වෙබ් අඩවිය: www.ircsl.gov.lk	ඊමේල්: info@ircsl.gov.lk
දුරකථනය: 011 2396184 - 9	ෆැක්ස්: 011 2396190

2026.08.11